OL/2014/40-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**40 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** | **පැය තුනයි** |
| சங்கீதம் (கீழைத்தேய) | **I, II** | மூன்று மணித்தியாலம் |
| **Music (Oriental)** | **I, II** | *Three hours* |

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. නිර්දේශිත රාග අතුරෙන් වැඩි ම කෝමල ස්වර සංඛ්‍යාවක් යෙදෙන රාගය කුමක් ද?
(1) භෛරවී (2) කාෆි (3) ඛමාජ් (4) භීම්පලාසි

2. නිරිස ........ නිරිගරිස ............. යන ස්වර ඛණ්ඩ අයත් වන රාගය තෝරන්න.
(1) බිලාවල් (2) යමන් (3) ඛමාජ් (4) භීම්පලාසි

3. සර්ගම් සඳහා අදාළ නො වන කරුණ තෝරන්න.
(1) ස්වර පමණක් තාලානුකූල ව යෙදේ.
(2) රාගයට අදාළ ස්වර සංගති ඇතුළත් වේ.
(3) රාගාවබෝධය ලැබීම සඳහා පුහුණු විය යුතු වේ.
(4) රාග විස්තර සහිත පද මාලාවකින් යුතු ගායන ශෛලියක් වේ.

4. අවරෝහණයේ දී පමණක් ස්වර හත ම යොදා ගැනෙන රාග දෙකකි.
(1) බිලාවල් සහ භූපාලි (2) භූපාලි සහ ඛමාජ්
(3) ඛමාජ් සහ භීම්පලාසි (4) භීම්පලාසි සහ භූපාලි

5. ගන්ධාරය (ග) වාදි ස්වරය සේ ගැනෙන රාග දෙකකි.
(1) කාෆි සහ බිලාවල් (2) බිලාවල් සහ යමන් (3) යමන් සහ භූපාලි (4) භූපාලි සහ භෛරවී

6. භූපාලි රාගයේ වර්ජිත ස්වර තෝරන්න.
(1) ග, ම (2) ග, ධ (3) ම, ධ (4) ම, නි

7. ජප් තාලයේ තාල සංකේත පිහිටා ඇති අයුරු දක්වන්න.
(1) X 2 0 3 (2) X 2 3 0 (3) X 0 2 3 (4) X 0 2 0

8. ආරෝහණයේ ද අවරෝහණයේ ද යෙදෙන ස්වර සංඛ්‍යාව අනුව තීරණය වන්නේ,
(1) වාදි ස්වරයයි. (2) රාග ජාතියයි. (3) ගාන සමයයි. (4) මේලයයි.

9. ඛමාජ් රාගයට අයත් තානාලංකාරය තෝරන්න.
(1) සරි ගම පධ නිස නිධ පම ගරි ස– (2) සරි ගම පධ නිස නිධ පම ගරි ස–
(3) ස– ගම පධ නිස නිධ පම ගරි ස– (4) ස– ගම පධ නිස නිධ පම ගරි ස–

10. භීම්පලාසි රාගයේ මේලය කුමක් ද?
(1) කාෆි (2) කල්‍යාණ (3) භෛරවී (4) ඛමාජ්

[දෙවෙනි පිටුව බලන්න

11. සරිසරිගගරිස, රිගරිගමමගරි යන ස්වර අභ්‍යාසයේ ඊලඟ ස්වර ඛණ්ඩය තෝරන්න.
(1) ගමගමපපමග (2) ගරිගරිමමපම (3) මගමගපධපධ (4) ධනිධනිපධනිස

12. ඖඩව සම්පූර්ණ ජාතියට අයත් රාගයකි.
(1) කාෆි (2) භීම්පලාසි (3) ඛමාජ් (4) භෛරවී

13. සප්තකයක යෙදෙන ස්වර අතුරෙන් චල ස්වර සේ සලකනුයේ,
(1) ස රි ම ප ධ (2) රි ග ම ප ධ (3) රි ග ම ධ නි (4) ග ම ප ධ නි


14. ශකීර් හුසේන් සහ ජග්ජිත් සිංග් යන භාරතීය සංගීතඥයින් දෙදෙනා ප්‍රවීණත්වයක් ඉසුලූ සංගීත අංග **දෙක** පිළිවෙළින් දැක්වෙනුයේ මෙසේ ය.
(1) තබ්ලා වාදනය සහ ගසල් ගායනය
(2) සන්තූර් වාදනය සහ ගසල් ගායනය
(3) බටනලා වාදනය සහ සිතාර් වාදනය
(4) තබ්ලා වාදනය සහ බටනලා වාදනය

15. රාගධාරී ශාස්ත්‍රීය ගායන අංගයක් ඉදිරිපත් කිරීමේ දී යොදා ගැනීමට සුදුසු ම භාණ්ඩ යුගලය තෝරන්න.
(1) තාම්පුරාව – බටනලාව
(2) සිතාරය – තබ්ලාව
(3) තාම්පුරාව – තබ්ලාව
(4) සන්තූර් – තාම්පුරාව

16. රාගයකට අදාළ තොරතුරු පිළිබඳ ව විස්තර ඇතුළත් ගී විශේෂය තෝරන්න.
(1) කව්වාලි (2) ලක්ෂණ ගී (3) ස්වර ස්ථාපන ගී (4) සර්ගම්

17. භාරතීය රාගධාරී සංගීත පද්ධතියට අදාළ වන ප්‍රධාන සංගීත ක්‍රම දෙක හඳුන්වන්න.
(1) හින්දුස්ථානි – වංග
(2) ගසල් – භජන්
(3) කර්ණාටක – භජන්
(4) හින්දුස්ථානි – කර්ණාටක

- අංක **18** සිට **21** තෙක් ප්‍රශ්නවලට පහත සඳහන් ස්වර පුවරු රූප සටහන අනුව පිළිතුරු සපයන්න.




18. වයලීනයේ තත් සතර පෙරදිග ක්‍රමයට සුසර කරන එක් ක්‍රමයක් අංකනය කර ඇති පිළිතුර තෝරන්න.
(1) 3, 7, 13, 17 (2) 3, 8, 15, 20 (3) 3, 10, 15, 22 (4) 3, 10, 17, 24

19. එස්රාජයේ සහ සිතාරයේ ප්‍රධාන තත සුසර කරනු ලබන ස්වරයට හිමි අංකය වන්නේ,
(1) 1 ය. (2) 3 ය. (3) 8 ය. (4) 12 ය.

20. සාමාන්‍ය බටනලාවක සිදුරු සියල්ල ම විවෘත කර පිඹීමෙන් උපදින ස්වරය දැක්වෙන අංකය වන්නේ,
(1) 8 ය. (2) 10 ය. (3) 12 ය. (4) 14 ය.

21. ඉහත සටහනේ 13, 17, 20 යන අංකවලට හිමි ස්වර තුන එකතු වීමෙන් සෑදෙන කෝඩ් (chord) එක කුමක් ද ?
(1) B flat major (2) C major (3) F major (4) G major

- අංක **22** සිට **24** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තාල අක්ෂර සටහන යොදා ගන්න.

තිං තිං නා / ති ට ති ට / තිං තිං නා / තු නා තු නා

ඉහත දැක්වෙනුයේ තබ්ලාවෙන් නිකුත් වන තාල අක්ෂර කිහිපයකි.

22. ඉහත තබ්ලා අක්ෂර සියල්ල නිකුත් කළ හැක්කේ,
(1) දායාවෙන් පමණක් වැයීමෙනි.
(2) බායාවෙන් පමණක් වැයීමෙනි.
(3) දායාවෙන් සහ බායාවෙන් එක විට වැයීමෙනි.
(4) දායාවෙන් සහ බායාවෙන් වෙන් වෙන් වශයෙන් වැයීමෙනි.

/තුන්වෙනි පිටුව බලන්න

23. ඉහත සටහනෙහි තාල අක්ෂර ප්‍රස්තාරගත කර ඇත්තේ,
(1) ජප් තාලයට අනුරූප ව ය. (2) කෙහෙර්වා තාලයට අනුරූප ව ය.
(3) ත්‍රිතාලයට අනුරූප ව ය. (4) දීප්චන්දි තාලයට අනුරූප ව ය.

24. ඉහත සටහනෙහි රිද්ම රටාවට අනුරූප වන දේශීය තිත් තාල රූපය තෝරන්න.
(1) සුළු මැදුම් දෙතිත (2) මැදුම් තනිතිත (3) මැදුම් මහ දෙතිත (4) මහ තනිතිත

25. සප්තකයේ ස්වර පිළිබඳ දැක්වෙන පහත සඳහන් කියමන් අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස – රි අතර අර්ධ ස්වරයක් නොමැත (2) රි – ග අතර අර්ධ ස්වරයක් නොමැත.
(3) ග – ම අතර අර්ධ ස්වරයක් නොමැත. (4) ම – ප අතර අර්ධ ස්වරයක් නොමැත.

- අංක **26** සහ **27** යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පාදය උපයෝගී කර ගන්න.

**"මන් මත් කරවන දන මුළු දෙරණා"**

26. ඉහත ගී පාදය
(1) ගැමි ගීයකට අයත් ය. (2) සේ ගීයකට අයත් ය.
(3) නාඩගම් ගීයකට අයත් ය. (4) නූර්ති ගීයකට අයත් ය.

27. එම ගී පාදයට අයත් සඳැස්මත් සංඛ්‍යාව
(1) 13 කි. (2) 14 කි. (3) 15 කි. (4) 16 කි.

28. නාඩගම් ශෛලියේ ආභාසය ලද නව නාට්‍යයකි.
(1) කාලගෝල (2) තාරාවෝ ඉගිලෙති (3) නරිබෑණා (4) රතු හැට්ටකාරි


29. විෂමග්‍රහයෙන් ඇරඹෙන ගී පද ඛණ්ඩය තෝරන්න.
(1) සසර වසන තුරු (2) හෙළ ජාතික අභිමානේ
(3) මේ සිංහල අපගෙ රටයි (4) සිනාවෙන් හෝ කතාවෙන් බෑ

30. රිද්ම රටා දෙකකින් සහ රිද්මයකින් තොර කොටස්වලින් සමන්විත ගීය තෝරන්න.
(1) ඇහැල මලින් ගස් පිරිලා (2) ගල්ලෙන බිඳලා
(3) ආලේ බැන්ද මාගේ රමණීය (4) කුමටද සොබනියෙ

31. ග්‍රැමෆෝන් තැටි ගී වර්ගයට අයත් වන ගී පාදය තෝරන්න.
(1) සිනිඳු සුදු මුදු තලාවේ (2) රත්නදීප ජන්මභූමි
(3) සාදු දන්ත දා (4) සිරි බුද්ධගයා විහාරේ

32. මෙහෙ ගී යටතට ගැනෙන ගී විශේෂය කුමක් ද?
(1) තුන් සරණේ ගී (2) නැළැවිලි ගී (3) වැදි ගී (4) බඹර ගී

- අංක **33** සිට **36** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන ඇසුරු කරගන්න.



A B C D

33. "දොං ජිංත ගත දොංත" යන පදය වැයීමට සුදුසු භාණ්ඩය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

34. "සඳුන් කොකුම් මොරසු ගාන" ගීය ඉදිරිපත් කිරීම සඳහා වාදනය වන භාණ්ඩය තෝරන්න.
(1) A (2) B (3) C (4) D


35. "ගම්භිර තෙදැති කොන්ස්තන්තිනු පුරේ" යන ගීතය සඳහා වාදනය වන භාණ්ඩය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

36. "වාසනා දිනේකි මේක" ගීතය සඳහා වාදනය කළ හැකි භාණ්ඩය තෝරන්න.
(1) A (2) B (3) C (4) D

/හතරවෙනි පිටුව බලන්න

56486

● අංක **37** සහ **38** යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය උපයෝගි කර ගන්න.



37. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කෙරෙනුයේ මෙසේ ය.
(1) ස ග - ස / නි̣ - ග - / රි ම ග රි / ස - ධ̣ -
(2) රි ම - රි / ස - ම - / ග ප ම ග / රි - නි̣ -
(3) ග ප - ග / රි - ප - / ම ධ ප ම / ග - ස -
(4) ම ධ - ම / ග - ධ - / ප නි ධ ප / ම - රි -

38. එම ස්වර ප්‍රස්තාරයේ විභාග (Bars) හතර සඳහා යොදා ගත හැකි කෝඩ්ස් (chords) සමූහය තෝරන්න.
(1) C / F / C / C (2) C / G / F / C (3) C / F / G / C (4) C / G / C / C

39. උච්ච 'ස්' ස්වරයෙහි කම්පන වාර සංඛ්‍යාතය 512 ක් වූ කල මධ්‍ය 'ස' ස්වරයෙහි සංඛ්‍යාතය කොපමණ ද?
(1) 64 (2) 240 (3) 256 (4) 264

40. ශබ්දය ග්‍රහණය කර ගැනීම සඳහා භාවිත කරන තාක්ෂණික උපකරණය තෝරන්න.
(1) මික්සර් (mixer) (2) ඇම්ප්ලිෆයර් (amplifier)
(3) ස්පීකර් (speaker) (4) මයික්‍රොෆෝන් (microphone)

* *

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

## සංගීතය (පෙරදිග) I, II
## சங்கீதம் (கீழைத்தேய) I, II
## Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

✳ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක **(i)** සිට **(iv)** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සසරිරිගුගුමමප යන ස්වරමාලාව අයත් වන රාගය නම් කරන්න.

(ii) යමන් රාගයේ යෙදෙන විකෘති ස්වරය කුමක් ද?

(iii) ඛමාජ් රාගයේ ආරෝහණයේ දී වර්ජ්‍ය වන ස්වරය කුමක් ද?

(iv) තාලයක සමස්ථානය සහ බලිය දැක්වීම සඳහා යොදා ගනු ලබන තාල සංකේත **දෙක** ලියා දක්වන්න.

● අංක **(v)** සිට **(viii)** තෙක් හිස්තැන්වලට සුදුසු පිළිතුරු මෙහි වරහන් තුළ ඇති පාරිභාෂික පද අතුරෙන් තෝරාගෙන ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (සමුද්‍රඝෝෂ විරිත, බෙම්ටෝ තාලය, දාදරා තාලය, අට විසිමත් විරිත)

| ගීතය | තාලය, විරිත |
|---|---|
| (v) සාදු දන්ත දා | ................................ |
| (vi) බැස සීතල ගඟුලේ | ................................ |
| (vii) රූ රුසේ අදිනා ලෙසේ | ................................ |
| (viii) පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට | ................................ |

● හිස්තැන් පුරවන්න.

(ix) (a) "ලංකා ලංකා පෙම්බර ලංකා" ගීතය ගයනු ලබන්නේ ................................................ විසිනි.

(b) "එන්ඩ ද මැණිකේ මමත් දියඹට" ගීතය ගයනු ලබන්නේ................................ විසිනි.

(x) 'මෝරා බීජයෙනා' යනුවෙන් ඇරඹෙන්නේ ................................................ වන්නම වන අතර 'ඉපිද එ බෝසත් නා ලොව වාරෙක' යනුවෙන් ඇරඹෙන්නේ ................................ වන්නම ය.

**2.** පහත දැක්වෙන්නේ රාගධාරී තොරතුරු ඇතුළත් වගුවකි.

| | රාගය | ථාටය | රාග ජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදී සංවාදී | මුඛ්‍යාංගය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|---|
| A | ......... | කල්‍යාණ | සම්පූර්ණ | සරිගමපධනිසං | ............... | ............... | නිරිගරිස පමගරිස | ............... |
| B | ඛමාජ් | ........... | ........... | ............... | සංනිධපමගරිස | ග, නි | ........... | රාත්‍රී දෙවන ප්‍රහරය |
| C | ......... | කාෆි | ........... | සරිගුමපධනිසං | සංනිධපමගුරිස | ........... | ........... | රාත්‍රී තෙවන ප්‍රහරය |

(i) ඉහත වගුවෙහි එක් එක් පේළියෙහි ඉංග්‍රීසි අකුර ද පිළිවෙළින් අදාළ පිළිතුරු **සතර ද** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ii) A හෝ B අතුරෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත වගුවේ නොමැති නිර්දේශිත රාගයකට අයත් පහත සඳහන් කරුණු ලියා දක්වන්න.
රාග ජාතිය, ආරෝහණ, වාදී, සංවාදී

**3.** (i) පහත වගුවේ එක් එක් ගී වර්ගය ද, ඊට අයත් ගීතය ද, දායකත්වය සැපයූ අයගේ නම් ද, අක්‍රමවත් ලෙස වගුගත කර ඇති අතර එම තොරතුරු ක්‍රමවත් ලෙස සකසා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

| A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|
| **ගී වර්ගය** | **ගීතය** | **දායකත්වය** |
| නව නාට්‍ය ගී | ශ්‍රී රාහුල හිමිගේ නාමේ | නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් |
| ග්‍රැමෆෝන් ගී | රකිනු ඊශ්වරා | ශිල්පිනී ලතා මංගෙෂ්කර් |
| දේශීය ශිල්පීන් ගැයූ චිත්‍රපට ගී | ශ්‍රී ලංකා මා ප්‍රියාදර ජය භූමි | කලාසූරී ලතා වල්පොල |
| නූර්ති ගී | ප්‍රේමයෙන් මන රංජිත වේ | එච්. ඩබ්. රූපසිංහ සූරීන් |
| විදේශීය ශිල්පීන් ගැයූ චිත්‍රපට ගී | රජින මමයි අපේ රාජ්ජේ | මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන් |

(ii) ග්‍රැමෆෝන් ගීත ගායනය සඳහා දායකත්වය සැපයූ **හතර දෙනකුගේ** නම් ලියන්න.

(iii) ග්‍රැමෆෝන් ගීත සංගීතවත් කළ සංගීතඥයින් **දෙදෙනකුගේ** නම් ලියන්න.

(iv) රේඛාව චිත්‍රපටයේ සංගීතය සහ ගීත පිළිබඳ ව ඔබ දන්නා තොරතුරු **හතරක්** ලියන්න.

**4.**

| A | B |
|---|---|
| බෙර පදය<br>තානම<br>කවිය<br>ඉරට්ටිය | දවුල් පදය<br>තානම<br>කවිය<br>කලාසම<br>අඩව්ව |

(i) ඉහත වගුවේ **A** සහ **B** තීරු දෙකෙන් කියැවෙන දේශීය ජන සංගීත අංග **දෙක** නම් කරන්න.

(ii) එම ජන සංගීත අංග දෙකට අයත් ගී **දෙකක** මුල් ගී පාදය බැගින් පද ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත එක් ගී පාදයකට අයත් ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න.

(iv) **A** සහ **B** සංගීත අංග දෙක පිළිබඳ සංසන්දනාත්මක කරුණු **හතරක්** ලියන්න.

**5.**



(i) ඉහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(ii) එම අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ කාලය (time signature) අපරදිග ක්‍රමයට ලියන්න. ඒ සඳහා **සමාන දේශීය** තිත්තාල රූපය ද නම් කරන්න.

(iii)  අපරදිග සංගීතයේ දී භාවිත වන මෙම සංකේතවලට හිමි මාත්‍රා සංඛ්‍යාව පිළිවෙළින් ලියන්න.

(iv) මෝසාර්ට් - බීතෝවන් යන අපරදිග සංගීතඥයින් දෙදෙනාගෙන් **එක් අයකු** පිළිබඳ ජීවන තොරතුරු **දෙකක්** හා සංගීතමය තොරතුරු **තුනක්** ලියන්න.

**6.** නිර්දේශිත තාල හතරක තොරතුරු ඇතුළත් වගුවක් පහත දැක්වේ.

| | තාල නාමය | තාල සංකේත | තාල පදය (ඨේකාව) | මාත්‍රා සංඛ්‍යාව | සර්ගමයක/මධ්‍යලය ගීයක/ලක්ෂණ ගීයක ප්‍රචලිත සරල ගීයක/මුල් පාදය |
|---|---|---|---|---|---|
| **A** | ........... | X O | ........... | 08 | ....................................... |
| **B** | ........... | ........... | ........... | 10 | නි ස \| ම ගු රි \| ස - \| අ නි ස |
| **C** | ........... | X O | ........... | .......... | ගලන ගඟකි ජීවිතේ |
| **D** | ත්‍රිතාල් | .......... | ........... | 16 | ............................................ |

(i) ඉහත වගුවෙහි එක් එක් පේළියෙහි ඉංග්‍රීසි අකුර ද පිළිවෙළින් අදාළ පිළිතුරු **තුන ද** ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ii) **B** හෝ **C** තාලයට අනුව නිර්මාණය වී ඇති සරල ගීයක හෝ චිත්‍රපට ගීයක හෝ නූර්ති ගීයක හෝ ස්ථායි කොටස පද ප්‍රස්තාර කරන්න.

(iii) **D** තාලය අනුව ගොඩනැගී ඇති මධ්‍යලය ගීයක හෝ වාදිතයක හෝ සර්ගමයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිත ව **ස්වර ප්‍රස්තාර** කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** පිළිබඳ උදාහරණ සහිත ව විස්තර කරන්න. (එක් මාතෘකාවකට කරුණු **හතරක්** සෑහේ.)

(i) කපිරිඤ්ඤා සංගීතය

(ii) අනාසාතාත්මක ජන ගී

(iii) සරල ගීයක ආකෘතිය

(iv) වයලින් පවුල හා අදාළ හඬතල

(v) කෝලම් සම්ප්‍රදාය

* * *